# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 6 ශ්‍රේණිය | නර්තනය | ඒකකය : 10 |
|---|---|---|

## ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන්

- **හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන තුළ යොදන්න.**

01) උඩරට නර්තන සම්ප්‍රදායේ දෙවොල් බෙරය වාදනය කරයි. ( )

02) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය වෙස් ඇඳුම් කට්ටලය වේ. ( )

03) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය කොහොඹා කංකාරිය වේ. ( )

04) සබරගමු පහන් මඩුවට වාදනය කරන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය යක් බෙරයයි. ( )

- **ප්‍රශ්න අංක 05 සිට 19 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

05) ශ්‍රී ලංකාවේ දේශීය නර්තන සම්ප්‍රදායන් ලෙස සලකනු ලබන්නේ,
01) උඩරට , පහතරට , සබරගමු නැටුම් ය.
02) උඩරට , පහතරට , භරත නැටුම් ය.
03) උඩරට , පහතරට , කෝලම් නැටුම් ය.
04) උඩරට , පහතරට , ගැමි නැටුම් ය.

06) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,
01) ගැටබෙරය යි. 02) දවුල යි.
03) යක් බෙරය යි. 04) තම්මැට්ටම යි.

07) උඩරට නර්තන කලාව ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
01) මහනුවර , සත් කෝරලය , කුකුලු කෝරල ය.
02) මහනුවර , සත් කෝරලය , සතර කෝරල ය.
03) මහනුවර , සත් කෝරලය , රයිගම් කෝරල ය.
04) මහනුවර , සත් කෝරලය , සියනෑ කෝරල ය.

08) උඩරට නර්තන ශිල්පියාගේ ප්‍රධාන ඇඳුම් කට්ටලය කුමක් ද?
01) සේලය 02) තනිකච්චිය
03) වෙස් ඇඳුම් කට්ටලය 04) නෛයන්ඩි ඇඳුම් කට්ටලය

09) උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මය කුමක් ද?
01) මල් මඩුව 02) කොහොඹා කංකාරිය
03) දෙවොල් මඩුව 04) වලියකුම් යාගය

10) කොහොඹා කංකාරි ශාන්තිකර්මය සඳහා වාදනය කරන්නේ,
01) උඩැක්කිය 02) දවුල
03) ගැටබෙරය 04) යක්බෙරය



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

11) පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
- 01) ශ්‍රී ලංකාවේ නිරිත දිග දකුණු මුහුදුබඩ ප්‍රදේශ
- 02) මීගමුවේ සිට කල්පිටිය දක්වා මුහුදුබඩ ප්‍රදේශ
- 03) කලුතර, මාතර සහ මහනුවර
- 04) උතුරු, නැගෙනහිර ප්‍රදේශ

12) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය කුමක් ද?
- 01) ගැටබෙරය 02) දවුල
- 03) යක්බෙරය 04) තම්මැට්ටම

13) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය කුමන නමකින් හඳුන්වයි ද?
- 01) තෙල්මේ ඇඳුම 02) පබලු ඇඳුම
- 03) වෙස් ඇඳුම 04) පන්තේරු ඇඳුම

14) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්තිකර්මය කුමක් ද?
- 01) කොහොඹා කංකාරිය 02) දෙවොල් මඩුව
- 03) පහන් මඩුව 04) ගරා යකුම

15) පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන් වඩාත් ප්‍රචලිත ප්‍රදේශ පිළිවෙලින් යොදා ඇත්තේ කුමන පිළිතුරේ ද?
- 01) කලුතර හා බලංගොඩ 02) කුරුණෑගල හා කලුතර
- 03) ගාල්ල හා කෑගල්ල 03) බලංගොඩ හා ගාල්ල

16) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,
- 01) දවුල යි. 02) තම්මැට්ටම යි.
- 03) ගැටබෙරය යි. 03) යක් බෙරය යි.

17) පබලු ඇඳුම් කට්ටලය අයත් නර්තන සම්ප්‍රදාය කුමක් ද?
- 01) උඩරට 02) පහතරට 03) සබරගමු 04) භරත

18) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය කුමක් ද?
- 01) කොහොඹා කංකාරිය 02) ගරා යකුම
- 03) පහන් මඩුව 04) දෙවොල් මඩුව

19) දවුල වාදනය කිරීම සඳහා යොදාගනු ලබන කෝටුව කුමන නමකින් හඳුන්වයි ද?
- 01) තම්මැට්ටම් කඩිප්පුව 02) දවුල් කඩිප්පුව
- 03) දඬුබෙර කෝටුව 04) දවුල් ලීය

- **කෙටි පිළිතුරු සපයන්න.**

20) දේශීය නර්තන සම්ප්‍රදායන් තුන නම් කරන්න.

21) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය කුමක් ද?

22) එය ප්‍රචලිත ප්‍රදේශ 03 ක් ලියන්න.

23) එහි ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය කුමක් ද?

24) පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 03 ක් නම් කරන්න.

25) සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 03 ක් නම් කරන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk